# BUSINESS ORGANIZATIONS
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>සංවිධානයක් යනු</u>

පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශී වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සමාජ ඒකකයක් සංවිධානයක් වේ.

**නිදසුන් :** පාසල, පන්සල, පල්ලිය, වෙළෙඳ සැල

## <u>විධිමත් සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ</u>

- අරමුණක් තිබීම
- පුද්ගලයින් සිටීම
- සංවිධාන ව්‍යුහයක් පැවතීම


# <u>ව්‍යාපාර සංවිධාන යනු</u>

ලාභ ඉපයීම හෝ සමාජ සුභසාධනය අරමුණු කර ගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා අලෙවි කිරීමේ නිරත ව්‍යවසායන් ව්‍යාපාර සංවිධාන වේ.

හිමිකාරත්වය මත පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර වශයෙන් ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කළ හැකි ය.

ClassWork.LK

# හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය




Class Work.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# කේවල ස්වාමි ව්‍යාපාර

හිමිකාරත්වය තනි පුද්ගලයකු සතු වන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වේ.

**නිදසුන් :**

- චතුලි සුපර් සෙන්ටර්
- දසත පොත් හළ
- ඉමල්කා සැලුන්

ClassWork.LK

## කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ

- අයිතිකරු විසින් තනි ව ප්‍රාග්ධනය සපයා ගැනීම
- කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් වීම
- අයිතිකරුගේ අසීමිත වගකීම
- ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නො මැති වීම
- ලියාපදිංචිය අනිවාර්ය නො වීම
- ලාභ හෝ අලාභ තනි ව භුක්ති විඳීම
- අවදානමට තනි ව මුහුණ දීම
- අඛණ්ඩ පැවැත්මක් නො මැති වීම
- ගිණුම් තැබීම අනිවාර්ය නො වීම
- ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නො වීම

ClassWork.LK

## කේවල ස්වාමි ව්‍යාපරවල වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- සියලු ලාභ අයිතිකරු සතු වීම
- ස්වාධීන තීරණ ගත හැකි වීම
- බලපවත්වනු ලබන නීතිරීති හා රෙගුලාසි අවම වීම
- ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම
- ව්‍යාපාරය පහසුවෙන් අවසන් කළ හැකි වීම
- ගනුදෙනුකරුවන් සමග සෘජු සම්බන්ධතා පවත්වාගත හැකි වීම
- පාලනය පහසු වීම

ClassWork LK

# කේවල ස්වාමි ව්‍යාපාරවල සීමා

- අයිතිකරුගේ අසීමිත වගකීම
- ප්‍රාග්ධනය සපයා ගැනීමේ දී දුෂ්කරතා මතු වීම
- අයිතිකරු විසින් ම තීරණ ගනු ලබන නිසා ඒවා අසාර්ථක විය හැකි වීම
- නෛතික පුද්ගලභාවයක් නො මැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නො මැති වීම
- ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම
- අලාභ තනිව භුක්ති විඳීමට සිදු වීම

ClassWork.LK

## කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම

කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වා ගෙන යන්නේ නම් 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කොට ගෙන ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතු ය.

ප්‍රායෝගික ව මෙම ලියාපදිංචිය අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කර ගත හැකි ය.

ClassWork.LK

## <u>කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය</u>

- ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කේවල ස්වාමි ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම

- අදාළ ප්‍රදේශයේ (ග්‍රාම සේවා වසමේ) ග්‍රාම නිලධාරීගෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ වාර්තාව ලබා ගැනීම

- ග්‍රාම නිලධාරි සහතික කළ වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තු ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම

- ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරු ව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS

# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# හවුල් ව්‍යාපාර

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල් ව්‍යාපාරයක් පහත පරිදි නිර්වචනය කර ඇත.

ලාභ ඉපැයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය හවුල් ව්‍යාපාරයක් වේ.

**නිදසුන් :**

- ගුණවර්ධන සහ පුත්‍රයෝ
- දොන් කරෝලිස් සහ පුත්‍රයෝ

# හවුල් ව්‍යාපාරයක ලක්ෂණ

- ලාභ ලැබීමේ අරමුණක් තිබීම
- ව්‍යාපාර කටයුත්තක් පැවතීම
- පුද්ගලයින් සිටීම
- අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් (එකඟතාවක් ) තිබීම

ClassWork.LK

## හවුල් ව්‍යාපාරයකට සුවිශේෂී ලක්ෂණ

- හවුල්කරුවන් අවම සංඛ්‍යාව දෙදෙනෙකු සිටිය යුතු අතර උපරිමය 20 ට සීමා වීම

- හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම

- ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් ඒකඟතාවක් දැකිය හැකි වීම

- සෑම හවුල්කරුවෙකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයකු හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම (අන්‍යොන්‍ය නියෝජිතත්වය)

- කිසියම් ව්‍යාපාර කටයුත්තක් පැවතීම

ClassWork.LK

## හවුල් ගිවිසුම

හවුල් ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කොට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කර ගනු ලබන එකඟතාව හවුල් ගිවිසුම ලෙස හඳුන්වයි.

හවුල් ගිවිසුමක් වාචික ව, ලිඛිත ව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකි ය.

## හවුල් ඔප්පුව

හවුල්කරුවන් අතර ඇති කර ගන්නා ලිඛිත ගිවිසුම, හවුල් ඔප්පුව හෙවත් හවුල් ව්‍යවස්ථාවලිය ලෙස හඳුන්වයි.

### හවුල් ඔප්පුවක් වැදගත් වීමට හේතු

- හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් බොහෝ දුරට විසඳා ගත හැකි වීම
- හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වා ගෙන යාමේ දී පහසුවක් වීම

ClassWork.LK

## හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් කරන කරුණු

- ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු

**නිදසුන් :**

ව්‍යාපාරයේ නම, හවුල්කරුවන්ගේ නම් හා ලිපින, ව්‍යාපාරයේ ස්වභාවය, හවුල් ව්‍යාපාරයේ කාල සීමාව

- ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
- ලාභාලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
- හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා
- ප්‍රාග්ධන පොළී හා ගැනිලි පොළී පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි
- අමතර ප්‍රාග්ධනය යෙදීම සම්බන්ධ කොන්දේසි

ClassWork.LK

- නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේ දී, සිටින හවුල්කරුවෙකු ඉවත් ව යාමේ දී, හවුල්කරුවෙකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය

## 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය

හවුල් ව්‍යාපාරයක ලිඛිත ගිවිසුමක් නො මැති විටක හෝ ගිවිසුමේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවක 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර ව කටයුතු කළ යුතු වේ.

## හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් කරුණු

- හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමාන ව බෙදා ගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමාන ව බෙදා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
- ව්‍යාපාරය වෙනුවෙන් හවුකරුවන් පෞද්ගලික ව දරන ලද වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතු ය.

- ගිවිසගත් ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% ක වාර්ෂික පොළියක් හිමි වේ.

ClassWork.LK

- ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසි ම හවුල්කරුවෙකුට හිමි නොවේ.

- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගී වීමට සෑම හවුල්කරුවෙකුට ම අයිතිය ඇත.

- කිසි ම හවුල්කරුවෙකුට තම සේවය වෙනුවෙන් වේතනයක් හවුල් ව්‍යාපාරයෙන් ලැබිය නො හැකි ය

- සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නැති ව නව හවුල්කරුවෙකු බඳවා ගත නො හැකි ය.

- හවුල් ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැන නගින සාමාන්‍ය ගැටලුවක දී හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණයක් ගත හැකි අතර, හවුල් ව්‍යාපාර කටයුතුවල ස්වභාවය වෙනස් කෙරෙන කිසිවක් සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් තොර ව කළ නො හැකි ය.

- හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ තැබිය යුතු අතර, ඕනෑ ම අවස්ථාවක දී ඒවා පරීක්ෂා කිරීමට, පිටපත් කර ගැනීමට සියලු ම හවුල්කරුවන්ට අවසර තිබිය යුතු ය.

ClassWork.LK

## හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය

හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට සමාන වේ.

## හවුල් ව්‍යාපාරයක වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- පහසුවෙන් විසුරුවා හැරිය හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම
- කිහිපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකි වීම
- වගකීම කිහිපදෙනෙකු අතර බෙදී යාම
- සාමූහික වගකීම නිසා ඇති වන උනන්දුව හා කාර්යක්ෂමතාව

ClassWork.LK

## හවුල් ව්‍යාපාරයක සීමා

- හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම

- හවුල්කරුවන් අතර ඇති විය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකරලෙස බලපෑම

- එක් හවුල්කරුවෙකුගේ ක්‍රියා කලාපය නිසා සියලුම හවුල්කරුවනගේ වගකීමට බැඳීම

ClassWork.LK

# කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර සැසඳීම

| **නිර්ණායකය** | **කේවල ස්වාමි ව්‍යාපාර** | **හවුල් ව්‍යාපාර** |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | එක් පුද්ගලයෙකි | අවමය 2 යි, උපරිමය 20 |
| ප්‍රාග්ධනය යෙදවීම | අයිතිකරු විසින් යොදවයි | හවුල්කරුවන් විසින් යොදවයි |
| පරිපාලනය | අයිතිකරු විසින් සිදු කරයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| වගකීම | තනි ව වගකියයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| ලාභපාඩු භුක්ති විඳීම | තනි ව භුක්ති විඳියි | සාමූහික ව වගකියයි |
| තීරණ ගැනීම | ස්වාධීන ව සිදු කරයි | හවුලේ භුක්ති විඳියි |
| විසුරුවා හැරීම | විසුරුවා හැරීමක් සිදු නොවේ.<br>අභිමත පරිදි ව්‍යාපාරය අවසන්<br>කළ හැකි ය | ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය<br>මගින් විසුරුවා හැරේ. |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## සමාගම්

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද පුද්ගලයින්ගේ එකතුවක් සමාගමක් ලෙස හැඳින්විය හැකි ය.

**නිදසුන් :**

සී/ස අරලිය සමාගම

සී/ස ප්‍රතිභා (පෞද්) සමාගම

## සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ

- සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයක් වීම
- සමාගමක් එහි සාමාජිකයන්ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම
- අඛණ්ඩ පැවැත්මක් හෙවත් නිත්‍ය සන්තතික හැකියාව තිබීම
- අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම
- කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම

ClassWork.LK

- කොටස් පැවරීමේ හැකියාව

## සීමාසහිත සමාගම්වල වාසි

- විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම

- මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම

- දක්ෂ කළමනාකරුවන් බඳවා ගෙන ව්‍යාපාර කටයුතු කර ගෙන යා හැකි වීම

- කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම නිසා ආයෝජකයින් ආකර්ශනය කර ගත හැකි වීම

- කොටස්කරුවකුගේ මරණය හෝ ඉවත් වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නො වීම

- ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කරගත හැකි වීම

- ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබීම

ClassWork.LK

# සීමාසහිත සමාගම්වල සීමා

- නීතිමය බලපෑම දැඩි වීම

- ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම හා ඒ සඳහා පිරිවැයක් දැරිය යුතු වීම

- කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමි වීම (one vote for one share) නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නො වීම

- සමාගමේ ලාභය මත මෙන් ම කොටස්කරුවන්ට හිමි වන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදු වීම නිසා ලාභ ද්විත්ව බදු ගණනයකට හසු වීම

- විසුරුවා හැරීමක දී වුව ද සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදු වීම

ClassWork.LK

## සමාගමක් සංස්ථාපනය කිරීම

සමාගමක් සංස්ථාපනය කිරීම අදාළ රටේ සමාගම් පනතට අනුව කළ යුතු අතර ශ්‍රී ලංකාවේ සමාගමක් සංස්ථාපනය කිරීම, 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත සිදු කළ යුතු ය.

ClassWork.LK

## සමාගමක් සංස්ථාපනය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය

- සමාගමේ නාමය ලියාපදිංචි කිරීම

- සමාගමේ යෝජිත නාමය දැනට පවත්නා සමාගමක නාමයට අනුරූප නො වන හෝ සමාන නො වන බවට තීරණය වූ පසු, පහත ලියවිලි ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

    - සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය

    - සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය

    - සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියා කිරීමට එක් එක්

    - ආරම්භක අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

    - සමාගමේ ලේකම්වරයා ලෙස බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශය

ClassWork LK


# සාංගමික ව්‍යවස්ථාවලිය

සමාගමේ පරමාර්ථ, සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්, සමාගම් කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ කරුණු ඇතුළත් කර සමාගම සංස්ථාගත කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වයා වෙත යැවිය යුතු වැදගත් ම ලියවිල්ල සාංගමික ව්‍යවස්ථාවලිය වේ.

- අදාළ සියලු ලියවිලි නිවැරදි බවට තහවුරු වූ පසු හා නියමිත ගාස්තු ගෙවීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සංස්ථාපන සහතිකය නිකුත් කරයි.

ClassWorkLK

# 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සංස්ථාගත කළ හැකි සමාගම් වර්ග




ClassWork.LK

# ඉහත එක් එක් සමාගම් වර්ගවල ලක්ෂණ

## සීමා සහිත සමාගම්

කොටස්කරුවන් මිල දී ගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා වන සමාගම් සීමාසහිත සමාගම් ලෙස හැඳින්විය හැකි ය.

සීමාසහිත සමාගම් වර්ග තුනකි.

## සී/ස පෞද්ගලික සමාගම්

කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නො මැති, අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිම සංඛ්‍යාව 50 ක් වන සමාගම් සීමිත පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වේ.

### සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ

- අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් වන අතර උපරිම සංඛ්‍යාව 50 ක් වේ. මෙම උපරිම ප්‍රමාණයට සමාගමේ සේවකයින් වන කොටස් කරුවන් අයත් නොවේ.

- අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව එකකි.

ClassWork.LK

- සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීම කළ නො හැකි ය.

- ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරික්ෂණයකින් තොර ව සියලු ම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදාහැරිය හැකි ය.

## <u>සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා නිදසුන්</u>

- සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම (පෞද්ගලික) සමාගම

- Lanka Clear (Pvt) LTD

- ශ්‍රී ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

ClassWork.LK

## සිමාසහිත පොදු සමාගම්

කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ මහජනයාට නිකුත් කිරීමට අවසර ඇති, අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමය සීමාවක් නො මැති සමාගම් සීමිත පොදු සමාගම් ලෙස හැඳින්විය හැකි ය.

## සිමාසහිත පොදු සමාගමක ලක්ෂණ

- අවම කොටස්කරුවන් සංඛ්‍යාව එක් අයෙකු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නො මැති වීම

- අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම

- කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි විම

- කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු වීම

ClassWork LK

## ලැයිස්තුගත පොදු සමාගම් (මිල කළ සමාගම්)

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වූ පොදු සමාගම් මිල කළ (ලැයිස්තුගත) සමාගම් ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

DFCC Bank PLC

සෙලින්කෝ පී එල් සී

## ලැයිස්තුගත නොවූ සමාගම් (මිළ නොකළ සමාගම්)

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොවූ සමාගම් නිල ලැයිස්තුගත නොවූ සමාගම් ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

සිලෝන් බිස්කට් කම්පැනි ලිමිටඩ්

සිමාසහිත මැලිබන් බිස්කට් සමාගම

Class Work LK

# අක්වෙරළ සමාගම්

යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර, එම රටින් පිටත ව්‍යාපාරික කටයුතු සිදු කරන සමාගම් අක්වෙරළ සමාගම් ලෙස හැඳින්වේ. එම සමාගම් ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන රටේ සමාගම් පනතට අනුව ද ලියාපදිංචි කළ යුතු වේ.

නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ සමාගමක් සිංගප්පූරුවේ ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දී සංස්ථාපනය කිරීම හා සිංගප්පූරුවේ දී ලියාපදිංචි කර ව්‍යාපාරික කටයුතු කළ යුතු ය.

**නිදසුන් :**

සන්රෙකෝ මැරීන් සමාගම

ඒෂියා ෆැසිපික් සමාගම

ClassWork.LK

## සීමාරහිත සමාගම්

කොටස්කරුවන්ගේ වගකම් අසීමිත වන එනම් සාංගමික ව්‍යාවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස්වල වටිනාකමට ඔවුන්ගේ වගකීම සීමා නො වන සමාගම් සීමා රහිත සමාගම් වේ.

## ඇපයෙන් සීමිත සමාගම්

කොටස් නිකුත් කිරීමක් සිදු නො කරන, සාමාජිකයින්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමට සීමා වන සමාගම් වේ.

**නිදසුන් :**

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු (ඇපකාර සමාගම)

ClassWork.LK

## ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ

- කොටස් නිකුත් කිරීමක් සිදු නො කිරීම
- සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවරකිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම
- අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නො වීම
- පොදු පරමාර්ථ පෙරදැරි කර ගෙන ආරම්භ කිරීම
- සමාගමේ ලාභ බෙදාහැරීමක් නො කිරීම

ClassWork.LK

## විදේශීය සමාගම්

- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා ඇති නමුත් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් විදේශීය සමාගමක් වේ.

- විදේශීය සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මසක් තුළ දී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

- සමාගම් රෙජිස්ට්‍රාර්වයා සමාගම පිළිබඳ ව පරීක්ෂා කර බලා එම සමාගම විදේශීය සමාගමක් සේ ලියාපදිංචි කරයි.

**නිදසුන් :**

හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් (HSBC)

## එකිනෙක සමාගම් වර්ග සැසඳීමට යොදා ගන්නා නිර්ණායක

- සාමාජික සංඛ්‍යාව
- වගකීම
- ප්‍රාග්ධන සම්පාදනය
- පරිපාලනය හා කළමනාකරණය

ClassWork.LK

# සීමිත පෞද්ගලික සමාගමක්, සීමිත පොදු සමාගමක් සමග සැසඳීම

| නිර්ණායකය | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | අවමය 01 උපරිමය 50 | අවමය 01 උපරිමය සීමාවක් නැත |
| වගකීම | මිල දී ගත් කොටස්වල වටිනාකමට සීමා වේ. | මිල දී ගත් කොටස්වල වටිනාකමට සීමා වේ. |
| ප්‍රාග්ධන සම්පාදනය | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ නො හැකි ය. | ප්‍රසිද්ධියේ මහජනයාට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ හැකි ය. |
| පරිපාලනය හා කළමනාකරණය | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වේ. අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 01 කි. | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වේ. අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 02 කි. |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS

# (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සමුපකාර ව්‍යාපාරය

ජාත්‍යන්තර සමුපකාර සංවිධානය, සමුපකාර ව්‍යාපාරය පහත පරිදි හඳුන්වා දී ඇත.

" සිය ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ම ය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක් මෙන් ම, සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යාපාරයකි."

**නිදසුන් :**

- සීමාසහිත මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය
- සීමාසහිත පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිය
- සීමාසහිත ධීවර සමුපකාර සමිතිය

ClassWork.LK

# සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ

- ස්වාධීන සංවිධානයක් වීම
- ස්වේඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම
- සාමාජිකයින්ගේ සාමූහික අයිතිය
- පොදු අවශ්‍යතා හා අපේක්ෂාවලින් යුතු වීම
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම
- කොටස්වල අගය වෙනස් නොවී පැවතීම (කොටසක අගය රු. 100)
- එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමිවීම (one man one vote)
- උපයන අතිරික්තය සාමාජිකයා සමිතිය සමග කළ ගනුදෙනුවල වටිනාකම අනුව සාමාජිකයින්ට ලබා දීම
- ලාභය මූලික අරමුණ නො වීම

ClassWork.LK

# 1995 මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළ සමුපකාර ප්‍රතිපත්ති

- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
- සාමාජික ආර්ථික සහභාගිත්වය
- ස්වෛරීභාවය හා නිදහස
- සමුපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබා දීම
- ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාව
- සමාජය පිළිබඳ සැලකිලිමත් වීම

ClassWork.LK

# සමුපකාර ව්‍යාපාරයේ වාසි

- සමුපකාර සමිතියක් ඇරඹීම පහසු වීම, 10 දෙනෙකු එකතු වී පහසුවෙන් හා අඩු මුදලකින් ඇරඹිය හැකි වීම

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම

- අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම

- විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම

- අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම

- සමිතිය උපයන අතිරික්තය සාමාජිකයින් සතු කිරීම හෙවත් අනුග්‍රාහක ප්‍රතිගෙවීම

ClassWork.LK

# සමුපකාර ව්‍යාපාරයේ සීමා

- මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම
- සමුපකාර ප්‍රතිපත්ති මත ම පිහිටා කටයුතු කිරීමට සිදු වීම
- සීමිත කාලයක් පමණක් විවෘත ව පැවතීම
- රාජ්‍ය අංශයේ මැදිහත් වීම සිදු වීම
- ණයට භාණ්ඩ අලෙවි කිරීමක් සිදු නො වීම
- කළමනාකරණ මණ්ඩලය ඡන්දයෙන් තෝරා පත්වන නිසා බොහෝ විට කාර්යක්ෂම නො වීම

ClassWork.LK

# සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය

ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම, 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මගින් අදාළ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් යටතේ සිදු කෙරේ.

සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී වයස අවුරුදු 18 ට වැඩි ඕනෑ ම පුද්ගලයින් 10 දෙනෙකු විසින් පහත දැක්වෙන ලියවිලි සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

- අයදුම් පත්‍රය
- අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
- යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
- සමුපකාර සමිතිය ලියාපදිංචිය සඳහා වූ යෝජනාව සම්මත වූ මහ සභා රැස්වීමේ වාර්තාව

ClassWork.LK

- ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින් සාමාජික ගාස්තු

- ගෙවන ලද බවටත්, එකී මුදල් කාරක සභාවේ භාරකාරිත්වයෙහි පවතින බවටත් කාරක සභාවේ සහතිකයක්

- සමිතිය පිහිටි ලිපිනයට ළඟා විය හැකි මාර්ගය දක්වන සටහනක්

ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ ලියවිලි සමුපකාර පනතට අනුකූල බව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා පරීක්ෂා කිරීමෙන් අනතුරු ව ලියාපදිංචි සහතිකය නිකුත් කෙරේ.

ClassWork.LK

# සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා

- ස්වයංසේවා වෙළෙඳසැල් අරඹීම හා වෙළෙඳසැල් නවීකරණය කිරීම

**නිදසුන් :**
කෝප් සිටි, කෝප් සුපර්

- නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම

  **නිදසුන් :**
  සමුපකාර රක්ෂණය, ඉන්ධන පිරවුම්හල්

- ජංගම වෙළෙඳපොළවල් ඇරඹීම

- විද්‍යුත් ගෙවීමේ ක්‍රම භාවිත කිරීම

ClassWork.LK

# සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා

- සමුපකාර විවෘත ව තබන වේලාවන් දීර්ඝ කිරීම
- ණයට භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධ ව අවධානය යොමු කිරීම
- කළමනාකරණ මණ්ඩලය සඳහා දක්ෂ පළපුරුදු, කාර්යක්ෂම පිරිසක් තෝරා ගැනීම
- විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම
- ස්වයංසේවා වෙළෙඳසැල් තවදුරටත් ව්‍යාප්ත කිරීම
- පාරිභෝගික ආකර්ෂණය සඳහා වෙළෙඳසැල දර්ශනීය ලෙස සකස් කිරීම
- සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම
- නව සාමාජිකයන් බඳවා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීම
- පාරිභෝගික සේවා සැපයීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS

# (Part-VI)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>වරලත් ව්‍යාපාර - Franchises</u>

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක්, එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව ලබා දෙයි නම්, එම ව්‍යාපාර සංවිධාන ක්‍රමය වරලත් ව්‍යාපාර (Franchises ) ලෙස හඳුන්වයි.

## <u>වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව</u>

- වරලත්හිමියා (Franchiser) - වරලත් සමාගමේ වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට වෙනත් ව්‍යාපාරවලට අවසර දෙන වරලත් සමාගම

- වරලත්ලාභියා (Franchisee) - වරලත් සමාගමෙන් අවසර ලබාගත් ආයතනය

ClassWork LK

## වරලත් ව්‍යාපාර වලට නිදසුන්

| වරලත්හිමියා | වරලත්ලාභියා |
|---|---|
| Mc Donalds | සී/ස අබාන්ස් රෙස්ටුරන්ස් (පෞද්.) සමාගම |
| KFC | කාර්ගිල්ස් සිලෝන් ලිමිටඩ් |
| Pizza hut | ගැමා පීසාක්‍රාෆ්ට් ලංකා (පෞද්.) සමාගම |

## වරලත් ගිවිසුම

වරලත් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී වරලත්ලාභියා හා වරලත්හිමියා අතර ඇති වන ගිවිසුම වරලත් ගිවිසුම (Franchise Agreement) වේ.

මෙම ගිවිසුම යටතේ වරලත්හිමියාගේ ව්‍යාපාර නාමය, වෙළෙඳ ලකුණ සහ ලාංඡනය භාවිත කිරීමට වරලත්ලාභියාට අවසර ලැබෙන අතර, ගිවිසුම තුළ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට අදාළ නීතිරීති, වරලත්හිමියා විසින් සපයන සේවා සහ මූල්‍ය කොන්දේසි, වරලත්ලාභියා විසින් ගෙවිය යුතු මූලික ගාස්තුව හා මාසික ව ගෙවිය යුතු පුරස්කාර සඳහන් වේ.

ClassWork.LK

## වරලත් ගිවිසුම අනුව වරලත්හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකම්

- සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම
- කළමනාකරණ පුහුණුව ලබා දීම
- අලෙවිකරණ සහාය ලබා දීම
- මූල්‍ය පහසුකම් ලබා දීම
- වෙළෙඳසැලේ නිමාව සකස් කර දීම
- නිෂ්පාදිතය හෙවත් භාණ්ඩ හා උපකරණ සැපයීම
- ශිල්පීය ඥානය ලබා දීම

## වරලත් ගිවිසුම අනුව වරලත්ලාභියා විසින් ඉටු කළ යුතු කාර්යයන්

- වරලත්හිමියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟ විම
- ප්‍රාග්ධනය ආයෝජනය කිරීම
- වරලත්හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් පමණක් භාණ්ඩ මිල දී ගැනීම
- වරලත්හිමියාට ගිවිසගත් පරිදි ගාස්තු ගෙවීම

ClassWork.LK

## වරලත් ව්‍යාපාර වර්ගීකරණය

- නිෂ්පාදිත වරලත් ව්‍යාපාර (Product Franchises)
- නිෂ්පාදන වරලත් ව්‍යාපාර ( Manufacturing Franchises )
- ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර (Business Format Franchises )

## නිෂ්පාදිත වරලත් ව්‍යාපාර

වරලත්හිමියාගේ වෙළෙඳ ලකුණු සහිත භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර නිෂ්පාදිත වරලත් ව්‍යාපාර වේ.

**නිදසුන් :**

ඛණිජ තෙල් විකිණීමේ අලෙවිසැල

( IOC ඉන්ධන පිරවුම්හල් )

ClassWork.LK

## නිෂ්පාදන වරලත් ව්‍යාපාර

වරලත්හිමියාගේ වෙළෙඳ ලකුණු යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදාහැරීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර නිෂ්පාදන වරලත් ව්‍යාපාර වේ.

**නිදසුන් :**
කොකා කෝලා, පෙප්සිකෝලා, වැනි සිසිල් බීම බෝතල් කිරීම හා බෙදාහැරීම සිදු කරන ආයතන

## ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර

වරලත්හිමියාගේ නමින් හා ක්‍රමය යටතේ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර වේ.

**නිදසුන් :**
Mc Donalds . KFC, Pittza Hut වැනි නිෂ්පාදිත ආහාර සපයන වෙළෙඳ ආයතන

Class Work.LK

# වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි

## වරලත්හිමියාට

- ඔහුගේ ම ආයෝජනයකින් තොර ව ව්‍යාපාරය පුළුල් කිරීමට හැකියාව ලැබීම

- ප්‍රචාරණ වියදම් වරලත්ලාභියා සමග බෙදාගත හැකි වීම

- වරලත්ලාභියාගේ ආයෝජනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වීම

- වරලත්ලාභියාගේ කාර්යක්ෂමතාව මත නිරායාසයෙන් ම ප්‍රතිලාභ ලැබිය හැකි වීම

- වරලත්ලාභියා මගින් පෝෂණය වීම

## වරලත්ලාභියාට

- වරලත්හිමියාගේ කීර්තිනාමය මත විශාල වෙළෙඳපොළක් ලබා ගත හැකි වීම

- අසාර්ථක වීමේ ප්‍රවණතාව අඩු වීම

ClassWork.LK

- ජනප්‍රිය වෙළෙඳනාම නිසා ප්‍රචාරණය පහසු වීම

- වරලත්හිමියාගේ කළමනාකරණ පුහුණුව ලැබීම

- වරලත්හිමියාගේ මූල්‍ය පහසුකම් ලැබීම

- අමුද්‍රව්‍ය අවම මිලකට ලබා ගත හැකි වීම

## <u>වරලත් ව්‍යාපාරවල සීමා</u>

## <u>වරලත්හිමියාට</u>

- වරලත්ලාභීන් අසාර්ථක වීමෙන් මොහුට ද ලාභ අඩු විය හැකි වීම

- වරලත්ලාභියාගේ අහිතකර ක්‍රියාකලාප වරලත්හිමියාගේ කීර්තිනාමය කෙරෙහි බලපෑ හැකි වීම

- වරලත්ලාභීන් උපයන ලාභයෙන් වැඩි කොටසක් ඔවුන් විසින් ම රඳවා ගැනීම

ClassWork.LK

## වරලත්ලාභියාට

- වරලත්හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම

- වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම

- ලාභය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතිය හැකි වීම

- වරලත්හිමියාගේ කීර්තිනාමය මත රැඳෙන නිසා ආයෝජන පිළිබඳ අවදානමක් පැවතීම
- වරලත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදු වන නිසා වරලත්ලාභියා දැඩි පීඩනයකට හසු වීම

ClassWork.LK

## ව්‍යාපාර සංයෝජන (Business Combinations)

ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යපාර ක්ෂේත්‍රයේ ප්‍රවණතාවකි.

සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජනය ලෙස හැඳින්විය හැකි ය.

## ව්‍යාපාර සංයෝජනය වීම සිදු කළ හැකි ආකාර

- ඒකාබද්ධ වීම (Mergers /Amalgamation)
- අත්පත් කර ගැනීම (Acquisition )

### ඒකාබද්ධ වීම

ඒකාබද්ධවීමක දී වෙන් වෙන් ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්ථනය වේ.

එය එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් මිලට ගැනශී මන් හෝ සංයෝජනය වන සමාගම්වල පැවති ව්‍යාපාර කටයුතු නිම කර ඒ අනුව නව සමාගමක් පිහිටුවීමෙන් කළ හැකි ය.

ClassWork.LK

## අත්පත්කර ගැනීම

අත්පත්කර ගැනීමක දී එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම සිදු වේ. කොටස් මිලට ගන්නා සමාගමට පාලන බලය හිමි වේ.

ClassWork.LK

## <u>ඒකාබද්ධ වීම් හෝ අත්පත් කර ගැනීම් මගින් සිදු වන සංයෝජන</u>

- තිරස් සංයෝජන (Horizontal combination)
- සිරස් සංයෝජන (Vertical combination)
- විෂම සංයෝජන (Conglomerate combination)

## <u>තිරස් සංයෝජන</u>

එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම තිරස් සංයෝජන වේ.

**නිදසුන් :**

- සපත්තු නිෂ්පාදන ආයතන දෙකක් සංයෝජනය වීම
- එම්බීඑස්එල් සේවිංග්ස් බැන්ක් ලිමිටඩ්, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී හා එම්බීඑස්එල් ෆයිනෑන්ෂල් සර්2015.01.01 සිට මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආරම්භ කිරීම

- මෘදුකාංග සංවර්ධන ආයතනයක් වන මයික්‍රසොෆ්ට් ආයතනය විසින් නොකියා (Nokia ) සමාගමේ පරිගණක මෘදුකාංග ඒකකය මිල දී ගැනීම

ClassWork.LK

- යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම සහ ඒෂියන් එලායන්ස් ජෙනරල් සමාගම ඒකාබද්ධ වී "ෆෙයාෆාස්ට් ඉන්ෂුවරන්ස් සමාගම" නමින් 2017 පෙබරවාරි 28 දින සිට ව්‍යාපාර කටයුතු සිදු කිරීම

- DFCC බැංකුව හා DFCC වර්ධන බැංකුව ඒකාබද්ධ වී DFCC Bank PLC ඇරඹීම

## සිරස් සංයෝජනය

කිසියම් නිෂ්පාදිතයක විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම සිරස් සංයෝජනය වේ.

**නිදසුන් :**

- සපත්තු නිෂ්පාදන සමාගමක්, හම් නිෂ්පාදනය කරන සමාගමක් හා සපත්තු අලෙවිකරණ සමාගමක්, සමග සංයෝජනය වීම

ClassWork.LK


## විෂම සංයෝජනය

එක සමාන නො වන වෙනස් වර්ගවල ව්‍යාපාර, සංයෝජනය වීම විෂම සංයෝජනය වේ.

**නිදසුන් :**

- සපත්තු නිෂ්පාදන සමාගමක්, බිස්කට් නිෂ්පාදන සමාගමක් සමග සංයෝජනය වීම

## ව්‍යාපාර සංයෝජනය වන ආකාර




ClassWork.LK

ඉහත ගැලීම් සටහනේ,

1) සිරස් සංයෝජනය කි.

2) තිරස් සංයෝජනය කි.

3) විෂම සංයෝජනය කි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# BUSINESS ORGANIZATIONS

# (Part-VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රාජ්‍ය අංශයේ ව්‍යාපාර

රජය හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වා ගෙන යන හා පාලනය කෙරෙන සියලු ම ව්‍යාපාර රාජ්‍ය අංශයේ නැතහොත් පොදු අංශයේ ව්‍යාපාර ලෙස සැලකේ.

පොදු අංශය මගින් ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන්නේ පොදු ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ය.

# රජය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට හේතු

- පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයම වැනි වෙළෙඳපොළ තත්ත්ව පාලනය කිරීමට

- ඒකාධිකාරී ආයතන බිහි වීම වැළැක්වීමට

- ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වා ගෙන යාමට

- පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට

ClassWork.LK

- රජයේ සැලැස්මක් හා පාලනයක් යටතේ ව්‍යාපාර කටයුතු සිදු වන බැවින් සම්පත් නාස්තිය අවම කර ගැනීමට
- ලාභ නො මැති, පෞද්ගලික අංශය අත නො ගසන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වා ගෙන යාමට

## රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග

- රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල
- රජයේ දෙපාර්තමේන්තු
- රාජ්‍ය සමාගම්
- පළාත් සභා හා පළාත් පාලන ආයතන යටතේ ඇති ව්‍යාපාර

ClassWork.LK

## රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ

- විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම
- නෛතික පුද්ගලභාවයක් හිමි වීම
- පූර්ණ අයිතිය හෝ වැඩි අයිතියක් රජය සතු වීම

- රජය විසින් පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය කිරීම
- රාජ්‍ය ණය, ලාභාංශ ප්‍රති ආයෝජන, මහජනතාව ණය ප්‍රාග්ධනයට දායක කර ගැනීම ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම
- අවම මිලකට ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම ප්‍රධාන අරමුණ වීම

**නිදසුන් :**

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

රාජ්‍ය සංස්ථා මණ්ඩල, අධිකාරිය, ආයතනය, සභාව, කාර්යාංශය ආදී විවිධ නම්වලින් හැඳින්වේ.

Class Work.LK

## රාජ්‍ය දෙපාර්තමේන්තුවක දැකිය හැකි ලක්ෂණ

- අමාත්‍යාංශයක් යටතේ රජයේ ඍජු පාලනයට යටත් වීම

- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි ආදී රජයේ ප්‍රතිපත්තිවලට අනුව ම කටයුතු කළ යුතු වීම

- බොහෝ විට සේවා සැපයීමේ නිරත ආයතන වීම

- දෙපාර්තමේන්තුවක් නීතිය ඉදිරියේ පුද්ගලයෙකු වශයෙන් පිළිනොගන්නා නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙන් නීතිය ඉදිරියේ පෙනී සිටිය යුතු වීම

- රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම

**නිදසුන් :**

- අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සෞඛ්‍යය දෙපාර්තමේන්තුව
- දුම්රිය දෙපාර්තමේන්තුව

ClassWork.LK

## <u>රාජ්‍ය සමාගමක දැකිය හැකි ලක්ෂණ</u>

- සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති සීමිත පොදු සමාගමක් වීම

- සමාගමේ මුළු ප්‍රාග්ධනයෙන් 51% ට වඩා වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ ආයතන සතු වීම

**නිදසුන් :**

- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
- සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
- ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
- සී/ස ලිට්‍රෝ ගෑස් සමාගම
- State Trading Company

ClassWork.LK

## පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ

- පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ පවත්වා ගෙන යාම

- අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම

- අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතන විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම

- පරිපාලනය පළාත් පාලන අධිකාරීන් විසින් සිදු කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”